ජී.එස්. අබේසේකර,
ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී (වැඩතහනම්),
L/1/1, ඇල්විටිගල මහල් නිවාස,
කොළඹ 08
2021.06.26

සී.ඩී. වික්‍රමරත්න මහතා,
පොලිස්පති,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01

**<u>ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී (වැඩතහනම්) ජී.එස්. අබේසේකරගේ සහ පවුලේ සාමාජිකයන්ගේ ජීවිත ආරක්ෂාව සැලසීම.</u>**

ආධුනික උපපොලිස් පරික්ෂකවරයකු වශයෙන් 1986.02.10 වන දින පොලිස් දෙපාතර්මේන්තුවට බැඳුණු මා කුරුඳුවත්ත පොලිස් ස්ථානය, විශේෂ කාය්‍ය බලකාය, නාරාහේන්පිට පොලිස් ස්ථානය, ග්‍රෑන්ඩ්පාස් පොලිස් ස්ථානය, මරදාන පොලිස් ස්ථානය යන ස්ථාන වලට අනුයුක්තව සේවය කොට ඉන් අනතුරුව අපරාධ පරීක්ෂණ දෙපාතර්මේන්තුවට අනුයුක්තව 2007.09.27 දින දක්වා සේවය කරන ලදී. අනතුරුව යාපනය කොට්ඨාශයට අනුයුක්තව 2009.04.01 දින දක්වා සේවය කොට නැවතත් අපරාධ පරීක්ෂණ දෙපාතර්මේන්තුවට අනුයුක්තව 2019.11.21 දින දක්වා සේවය කොට ගාල්ල දිසාව භාර නියෝජ්‍ය පොලිස්පතිවරයාගේ පුද්ගලික සහකාර වශයෙන් සේවය කරමින් සිටියදී 2020.01.07 වන දින මාගේ රාජකාරී වැඩතහනම් කරන ලදී. ඉන් අනතුරුව කොළඹ අපරාධ කොට්ඨාශය මගින් මා 2020.07.31 වන දින අත්අඩංගුවට ගෙන එදිනම ගම්පහ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක බී/1536/20 දරන නඩුව යටතේ මහර රක්ෂිත බන්ධනාගාරගත කරන ලදී. මා ඉහත කාලවකවානුව තුළදී පොලිස් පරීක්ෂක, ප්‍රධාන පොලිස් පරීක්ෂක, සහකාර පොලිස් අධිකාරී, පොලිස් අධිකාරී සහ අත්අඩංගුවට ගන්නා අවස්ථාව වන විට ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී තනතුරේ රාජකාරි කළ අතර මා 2017.09.09 වන දින සිට 2019.11.21 දින දක්වා අධ්‍යක්ෂ, අපරාධ පරීක්ෂණ දෙපාතර්මේන්තුව වශයෙන් රාජකාරි කරන ලදී.

මහර බන්ධනාගාරගතව සිටියදී 2020.11.24 වන දින කොවිඩ්-19 වෛරසය ආසාධනය වීම හේතුවෙන් වැලිකඩ බන්ධනාගාර රෝහලටද අනතුරුව පොලොන්නරුව පිහිටි ගල්ලැල්ල අතරමැදි ප්‍රතිකාර මධ්‍යස්ථානයටද ඉන් අනතුරුව වැලිකන්ද රෝහලටද ඉන්පසු මුල්ලේරියාව IDH රෝහලටද ප්‍රතිකාර සඳහා යොමු කරන ලදී.

මා හට Covid-19 වෛරසය ආසාධනය වීමට අමතරව, අධික රුධිර පීඩනය සහ රුධිරයේ සීනි ප්‍රතිශතය ඉහල අගයක පැවතීම යන රෝග තත්වයන් පැවතියදී කොළඹ සිට පොලොන්නරුව දක්වා, බන්ධනාගාර බස් රථයක Covid-19 වෛරසය ආසාධිත රැඳවියන් බොහෝ පිරිසක් සමග 2019.11.25 වන දින රාත්‍රී කාලයේ දැඩි අපහසුකම් මධ්‍යයේ දීඝර් ගමනක යෙදීමට සිදුවීම හේතුවෙන්, ගල්ලැල්ල පිහිටි අතරමැදි ප්‍රතිකාර මධ්‍යස්ථානයේදී මා හට හෘදයාබාධයක් ඇති විය. එම රෝගී තත්වයන්ට මූලික ප්‍රතිකාර වැලිකන්ද රෝහලේදීද ඉන් අනතුරුව IDH රෝහලේදීද සිදුකරන ලද අතර, මා වැඩිදුර ප්‍රතිකාර සඳහා 2019.12.22 දින ජාතික රෝහලේ 42 වන වාට්ටුවට ඇතුලත් කොට ඉන් අනතුරුව, 2020.01.18 වන දින හෘදයාබාධය සම්බන්ධයෙන් එන්ජියෝග්‍රෑම් පරීක්ෂණයක් ජාතික රෝහලේ හෘද රෝග ඒකකයේදී සිදුකරන ලදී. එම පරීක්ෂණයේදී අනාවරණය වූ පරිදි මාගේ හෘදයට රුධිරය සපයනු ලබන වම්පස ප්‍රධාන ධමනිය සම්පූණර්යෙන් අවහිරවී ඇති බවටත්, දකුණුපස ධමනියද 70% ක් අවහිර වී ඇති බවටත් හෘද රෝග විශේෂඥ වෛද්‍ය චන්ද්‍රික පොන්නම්පෙරුම මහතා මා හට දැනුම් දුන් අතර,

ඒ සඳහා දකුණුපස ධමනියේ අවහිරය විවෘත කිරීම සඳහා ස්ටෙන්ට් එකක් යෙදීමට අවශ්‍ය බවටත්, වම්පස ධමනියේ අවහිරය සඳහා ඒ අවස්ථාවේදී ප්‍රතිකාර කිරීමට හැකියාවක් නොමැති බවටත් දැනුම්දෙන ලදී. ඒ අනුව මාගේ හෘදයට රුධිරය සපයනු ලබන දකුණුපස ධමනියට 2020.02.18 දින ස්ටෙන්ට් එකක් යොදන ලද අතර, එදිනට පසු දිනම එනම් 2020.02.19 දින මා වැලිකඩ බන්ධනාගාර රෝහලට මාරුකර යවන ලදී. (අදාළ වෛද්‍ය සහතික වල පිටපත් ඇමුණුම A වශයෙන් සලකුණු කොට මේ සමග අමුණා ඇත)

මා හට ඇප ලබාගැනීම සඳහා ගම්පහ මහාධිකරණය වෙත ඇප අයදුම්පත් අංක HC/BA/339/2020 යටතේ ඉදිරිපත් කරන ලද අතර, එම ඇප අයදුම්පත ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් ඇප ලබාගැනීම සඳහා ගරු අභියාචනාධිකරණය වෙත ප්‍රතිශෝධන ඇප අයදුම්පතක් අංක CA/CPA/18/2021 යටතේ ඉදිරිපත් කරන ලදී. මේ සම්බන්ධයෙන් විභාගයක් සිදුකල අභියාචනාධිකරණය විසින් මා හට 2021.07.16 වන දින ඇප ලබාදෙමින් ඇප නියෝගයක් ප්‍රකාශයට පත්කරන ලද අතර, එම ඇප නියෝගය පදනම් කොටගෙන මා ඇප මත දැනට ඉහත ලිපිනය ඇති මාගේ නිවසේ වෛද්‍ය ප්‍රතිකාර ලබමින් පසුවෙමි.

මා සක්‍රීය සේවයේ යෙදී සිටියදී දිවයිනේ විවිධ ප්‍රදේශ වලදී සිදුකරන ලද අපරාධ බොහෝ ගණනක් සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා, ඒ සම්බන්ධයෙන් වගකිවයුතු පුද්ගලයින්ට එරෙහිව ගරු නීතිපතිතුමා විසින් දිවයිනේ පිහිටි විවිධ අධිකරණ ඉදිරියේ නඩු පැවරීමෙන් පසු එම අපරාධ සම්බන්ධයෙන් ඍජුව වගකිවයුතු චූදිතයින්ට එරෙහිව මරණීය දණ්ඩනයෙන්ද, ජීවිතාන්තය දක්වා සිරදඬුවම්ද ඇතුළුව බරපතල දඬුවම් ලබාදීමට කටයුතුකොට ඇත. ඊට අමතරව මේ වනවිටත් මාගේ ඍජු මැදිහත්වීම මත සිදුකරන ලද ඉතා සංකීර්ණ හා ඉතා සංවේදී අපරාධ ගණනාවක් සම්බන්ධයෙන් අධිකරණ වල නඩු කටයුතු පවත්වාගෙනයනු ලබන අතර, තවත් අපරාධ ගණනාවක් සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාතර්මේන්තුව මගින් පරීක්ෂණ පවත්වාගෙන යනු ලබයි. (මා විසින් සිදුකරන ලද ඉහත පරීක්ෂණ හා සම්බන්ධ විස්තර ඇතුළත් ලේඛනයේ පිටපතක් ඇමුණුම B වශයෙන් සලකුණු කොට මේ සමග අමුණා ඇත)

ඉහතින් මා සඳහන් කළ විමශර්න පාදක කොටගෙන යුධ හමුදා, නාවුක හමුදා සහ පොලිස් නිළධාරීන්ට එරෙහිවද, සංවිධානාත්මක අපරාධ කල්ලි වල සාමාජිකයන්ට හා ත්‍රස්තවාදී සංවිධාන වල සාමාජිකයන්ට එරෙහිවද නඩු කටයුතු පවත්වාගෙන යනු ලබන අතර, තවත් පිරිසකට අධිකරණ මගින් දඬුවම් ලබාදීම හේතුවෙන් ඔවුන් බන්ධනාගාරයේ සිරදඬුවම් විඳිමින් පසුවෙයි. මා විසින් සිදුකරන ලද විමශර්න හේතුකොට ගෙන නිරන්තරයෙන් මාගේ ජීවිතයට හා මාගේ පවුලේ සාමාජිකයන්ගේ ජීවිත වලට මරණීය තජර්න නිරන්තරයෙන් එල්ලවී ඇති අතර, මාගේ රාජකාරී වැඩතහනම් කරන ලද 2020.01.07 වන දින පැය 23:23ට මාගේ ජංගම දුරකථනය වෙත අංක 501 දරන දුරකතනයෙන් මා සහ මාගේ පවුලේ සාමාජිකයින් ඝාතනය කරන බවට ලද මරණීය තජර්නය සම්බන්ධයෙන් මා විසින් ඔබතුමා වෙත 2020.01.08 වන දින ලිඛිතව පැමිණිලි කරන ලද බවද මෙහිලා සඳහන් කරමි. (අදාළ පැමිණිල්ලේ පිටපතක් ඇමුණුම C වශයෙන් සලකුණු කොට මීට අමුණා ඇත)

පූවර්ගාමී පොලිස්පති එන්.කේ. ඉලංගකෝන් මහතා වෙත ජාතික බුද්ධි සේවාව විසින් මා හට ජීවිත අනතුරක් ඇති බවට ඉදිරිපත්කොට තිබූ වාතර්ාවක් පදනම් කොටගෙන මා හට සහ මාගේ නිවසට විශේෂ කාය්‍ර බලකායේ නිලධාරීන්ගේ ආරක්ෂාව සහ ආරක්ෂක කටයුතු සඳහා යොදාගැනීමට නිල රථයට අමතරව ජීප් රථයක් ලබාදී තිබූ අතර මා ගාල්ල දිසාව වෙත 2019.11.21 වන දින ස්ථාන මාරුවීම් සිදුකිරීමෙන් පසු එම ආරක්ෂක විධිවිධාන සියල්ල ඔබතුමා විසින් ඉවත් කර ඇත.

මා රාජකාරී කාලය තුළදී නිත්‍යානුකූලවත්, අපක්ෂපාතිවත්, විනිවිධභාවයෙන් යුතුවත්, මා වෙත පැවරුණු රාජකාරි කටයුතු කැපවීමෙන් හා උනන්දුවෙන් සිදුකළ අතර මාගේ රාජකාරීමය ක්‍රියාකාරිත්වය හේතුවෙන් විවිධ අපරාධ වලට වගකිවයුතු ප්‍රභල දේශපාලඥයින්ගෙන්, උසස් පොලිස් නිලධාරීන්ගෙන්, යුධ හමුදා සහ නාවුක හමුදා උසස් නිලධාරීන්ගෙන්ද, සංවිධානාත්මක අපරාධ කල්ලි වල සාමාජිකයින්ගෙන් සහ ත්‍රස්තවාදී සංවිධාන වල ප්‍රභලයින්ගෙන් මා හට සහ මාගේ පවුලේ සාමාජිකයින්ගේ ජීවිත වලට නිරන්තරයෙන් තර්ජන ඇති බව විශේෂයෙන් මෙහි සඳහන් කරන අතර, ඒ සම්බන්ධයෙන් මා සහ බිරිඳ මෙයට පෙර වින්දිතයින් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ කොට්ඨාශයටද, මානව හිමිකම් කොමිෂන් සභාවටද, පොලිස් කොමිසමටද, ගරු අගවිනිසුරුතුමාටද, ගරු නීතිපතිතුමාටද, ඔබතුමාටද ලිඛිතව පැමිණිලි කොට ඇතත් මෙතෙක් මා හට සහ මාගේ පවුලේ සාමාජිකයන් හට ප්‍රමාණවත් ආරක්ෂාවක් සපයා නොමැති බව කණගාටුවෙන් වුවත් දැනුම්දීමට සිදුව ඇත.

ඉහත සඳහන් කරුණු කෙරෙහි විවෘත මනසින් යුතුව අවධානය යොමු කළහොත්, මා විසින් සඳහන් කොට ඇති තර්ජනයන් එල්ලවීමට හේතුව මා සිදුකරන ලද නිත්‍යානුකූල රාජකාරී පදනම් කොටගෙන දිවයිනේ විවිධ අධිකරණ මගින් දඬුවම් පමුණුවන ලද හා දැනට විවිධ අධිකරණ වල විභාග වන නඩු වලට අදාළ වූදිතයින් මා කෙරෙහි දැඩි වෛරයෙන් පසුවීම හේතුවෙන් බව ප්‍රකටව පෙනී යන කරුණකි. ඒ අනුව මා අපරාධයක වින්දිතයින් හා සාක්ෂිකරුවන් සඳහා පහසුකම් සහ ආරක්ෂාව සැපයීමේ පනත යටතේ ආරක්ෂාව සැලසිය යුතු සාක්ෂිකරුවකු බව මෙහිලා විශේෂයෙන් සඳහන් කරමි.

මා අත්අඩංගුවට ගෙන රක්ෂිත බන්ධනාගාරගත කිරීමට කටයුතු කරන ලද පොලිස් නිලධාරීන් හා ඔවුන්ව අධීක්ෂණය කරනු ලබන පොලිස් නිලධාරීන්ගේ පූවර් ක්‍රියාකාරකම් හා ඔවුන් මාධ්‍යට සිදුකරන ලද ප්‍රකාශයන් කෙරෙහි අවධානය යොමු කිරීමේදී, මා හට සහ මාගේ පවුලේ සාමාජිකයන් හට ඉතා අත්‍යාසන්න හා ප්‍රබල ජීවිත අවධානමක් ඇති බව ප්‍රකටව පෙනී යන හෙයින් මා හට සහ මාගේ පවුලේ සාමාජිකයින්ගේ ජීවිත අනාරක්ෂිත බව වැටහෙන බැවින් අපගේ ආරක්ෂාව සැලසීම සඳහා පූවර්ගාමීව ලබාදී තිබූ ආරක්ෂක විධිවිධාන කඩිනමින් නැවත ලබාදෙන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි. මේ සම්බන්ධයෙන් කඩිනම් පියවර ඔබතුමා විසින් ගනු ඇතැයි මා තරයේ විශ්වාස කරමි.

මෙයට,

ජී.එස්. අබේසේකර
ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී (වැඩතහනම්)

පිටපත් -:

1. සභාපතිතුමා - ජාතික පොලිස් කොමිෂන් සභාව
2. සභාපතිතුමා - මානව හිමිකම් කොමිෂන් සභාව
3. සභාපතිතුමා - වින්දිතයන් හා සාක්ෂිකරුවන්ට ආරක්ෂාව සැපයීමේ අධිකාරිය